2026.11.04

ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ/
අධ්‍යක්ෂ (ප්‍රවෘත්ති) / ප්‍රවෘත්ති කළමනාකරු / වෙබ් අඩවි කර්තෘ,

"රටම එකට" ජාතික මෙහෙයුමට වසරක් සම්පූර්ණ වීම හා සමගාමීව වැඩසටහන් රැසක්

විෂ මත්ද්‍රව්‍ය උවදුර ශ්‍රී ලංකාවෙන් මුලිනුපුටා දැමීමේ අරමුණින් 2025 ඔක්තෝබර් 30 දින ආරම්භ කළ "රටම එකට" ජාතික මෙහෙයුමට මේ වන විට වසරක් සම්පූර්ණ වී ඇත. විෂ මත්ද්‍රව්‍ය ජාවාරම හා භාවිතය ශ්‍රී ලංකාවෙන් මුලිනුපුටා දැමීමත් විෂ මත්ද්‍රව්‍ය කෙරෙහි යොමුවීම වැළැක්වීම වෙනුවෙන් ජනතාව දැනුවත් කිරීම හා භාවිතයට යොමු වී ඇති පිරිස් නිසි ලෙස පුනරුත්ථාපනය කිරීමත් මූලික අරමුණු ලෙස සලකා ක්‍රියාත්මක වන මෙම ජාතික මෙහෙයුම මේ වන විටත් සමස්ත ශ්‍රී ලාංකීය ප්‍රජාව වෙනුවෙන් විශිෂ්ඨ කාර්යය සාධනයක් ඉටු කර ඇත.

"රටම එකට" ජාතික මෙහෙයුමට වසරක් සම්පූර්ණ වීම හා සමගාමීව "එක්ව නැගී සිටි වසරක්" යන තේමාව යටතේ වැඩසටහන් රැසක් ක්‍රියාත්මක වේ.

I. දැනුවත් කිරීමේ පා ගමන

ඒ අනුව, හෙට, එනම් 2026 නොවැම්බර් 05 දින පෙ.ව.8.00 ට කොළඹ ගාලු මුවදොර පිටියේ සිට කොල්ලුපිටිය මංසන්ධිය දක්වා විෂ මත් නිවාරණ පා ගමනක් පැවැත්වීමට කටයුතු යොදා තිබේ. "මතින් නිදහස් සෞඛ්‍යමත් ජාතියක් බිහි කරන්නට සැවොම එක්වෙමු" යන තේමාව සමග සංවිධානය කරන මෙම පාගමන ජනාධිපති ලේකම් කාර්යාලය, මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, පුනරුත්ථාපන කාර්යාංශය, ජාතික තරුණ සේවා සභාව ඇතුලු රාජ්‍ය ආයතන හා ආරක්ෂක අංශවල සහභාගිත්වයෙන් ක්‍රියාත්මක වේ. මෙම පා ගමනට පොදු මහජනතාව, සිවිල් සංවිධාන මෙන්ම රට තුළ විෂ මත් විරෝධී සටනට උරදෙන ස්වේච්ඡා සංවිධාන ද සහභාගි වෙති. විෂ මත් උවදුර පිටුදැකීම පිළිබඳව ජනතාව සක්‍රියව දැනුවත් කිරීම මෙහි අරමුණයි.

II. ආගමික සමුළුව

එමෙන්ම, "රටම එකට" ජාතික මෙහෙයුමෙහි වර්ෂ පූර්ණය හා සමගාමීව හෙට (05) පස්වරු 2.00 ට අරලියගහ මන්දිරයේ දී ආගමික සමුළුවක් පැවැත්වීමට කටයුතු සංවිධානය කර තිබේ. අතිපූජනීය මහාසංඝරත්නය, හින්දු, ඉස්ලාම්, කිතුනු පූජ්‍ය උතුමන් ඇතුලු ආගමික නායකයින්ගේ උපදෙස් හා මගපෙන්වීම යටතේ විෂ මත් උවදුර පිටුදැකීමේ පණිවිඩය සමාජගත කරමින් සමස්ත ප්‍රජාව තුළ මෙම ජාතික මෙහෙවර පිළිබඳ ධනාත්මක ආකල්ප ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් පවත්වන මෙම ආගමික සමුළුවට ගරු ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමා ද සහභාගි වීමට නියමිතය.

ප්‍රචාරක අංශය

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව